අමාලි
ලියනගේ
(බදු හා ව්‍යාපාර
උපදේශක)



# භාණ්ඩ හා සේවා බද්ද

## (GST - Goods & Services Tax)

භාණ්ඩ හා සේවා බද්ද ඕස්ට්‍රේලියාව ඇතුලත ඇති බොහෝ භාණ්ඩ, සේවාවන් හා අනිකුත් පාරිභෝජන අයිතමයන් සඳහා දැනට 10%ක අනුපාතයකින් අයකරනු ලැබේ. එසේම, සමහර භාණ්ඩ හා සේවාවන් මෙම බද්දෙන් නිදහස් කර ඇත.

### භාණ්ඩ හා සේවා බදු නිදහස් අයිතමයන් (GST Free Goods)

1* බොහෝමයක් මූලික ආහාර වර්ග
2* සමහර අධ්‍යාපනික සේවාවන් හා පාඨමාලා සේවාවන්
3* සමහර සෞඛ්‍ය සේවාවන්
4* සමහර සෞඛ්‍ය සේවාවන් සම්බන්ධ භාණ්ඩ
5* සමහර බෙහෙත් ද්‍රව්‍ය
6* සමහර අපනයන
7* ජල සම්පාදනයන්
8* විදේශ ගමන් හා ඒ ආශ්‍රිත කරුණු
9* ජාත්‍යන්තර තැපැල් සේවාවන්
10* සමහර ආගමික සේවාවන්

### සුවිශේෂ භාණ්ඩ හා සේවා බදු නිදහස් අයිතමයන් (Input Taxed Credit)

1* මූල්‍යමය සේවාවන් (Financial Supplies)

- ණය ගනුදෙනු

- කොටස් මිලදී ගැනීම් හා විකිණීම්

2* ජීවත්වීම සඳහා වන නිවාස කුලියට දීමේදී හෝ විකිණීමේදී

### භාණ්ඩ හා සේවා බදු සඳහා ලියා-පදිංචි වීම (Registration)

භාණ්ඩ හා සේවා බදු සඳහා ලියාපදිංචිය අනිවාර්ය ව්‍යාපාර ලෙස

1* වාර්ෂික පිරිවැටුම $75,000 වඩා වැඩි ව්‍යාපාර ආයතන
2* වාර්ෂික පිරිවැටුම $150,000 වඩා වැඩි ව්‍යාපාර ආයතන
3* කුලී රථ සේවාව සපයන ආයතන හා පුද්ගලයන් (පිරිවැටුමේ ප්‍රමාණය මෙහිදී සළකණු නොලැබේ)

### භාණ්ඩ හා සේවා බදු වාර්තා කිරීම හා ගෙවීම් කාලපරිච්ඡේද

භාණ්ඩ හා සේවා බදු ගෙවීම් පහත කාලපරිච්ඡේදයන් තුල කල හැක.

1* මාසිකව

ආයතනයක භාණ්ඩ හා සේවා බදුවලට යටත්වන පිරිවැටුම ඩොලර් මිලියන 20 වඩා වැඩිනම්, එවැනි ආයතන එම බදු වාර්තා කිරීම හා ගෙවීම සෑම මසකම අනිවාර්යෙන් කල යුතුය.

2* කාර්තුවකට වරක්

ආයතනයක භාණ්ඩ හා සේවා බදුවලට යටත්වන පිරිවැටුම ඩොලර් මිලියන 20 වඩා අඩුනම් හෝ මාසිකව වාර්තා කිරීම අනිවාර්ය කර නැතිනම්, එවැනි ආයතන වලට කාර්තුවකට වරක් බදු වාර්තා කිරීම හා ගෙවීම කල හැක.

3* වර්ෂයකට වරක්

කිසියම් ආයතනයක් ස්වේච්ඡාවෙන් භාණ්ඩ හා සේවා බදු සඳහා ලියාපදිංචි වී ඇත්නම් එවැනි ආයතනවලට මෙම තෝරාගැනීම කල හැකි වේ.

### භාණ්ඩ හා සේවා බදු ගෙවීම කල යුතු දින

1* මාසිකව ගෙවීම් කරන ව්‍යාපාර

මාසිකව භාණ්ඩ හා සේවා බදු ගෙවීම් සිදුකරන ආයතන අදාල මාසයේ බදු ගෙවීම හා වාර්තා කිරීම ඊළග මාස 21 දිනට පෙර කල යුතු වේ.

උදා: ජනවාරි මාසයේ භාණ්ඩ හා සේවා බදු වාර්තා කිරීම හා ගෙවීම පෙබරවාරි මස 21 දාට පෙර කල යුතු වේ.

2* කාර්තුවකට වරක් ගෙවීම තෝරාගත් ව්‍යාපාර

### කාර්තුව ගෙවීම් කලයුතු දිනය

ජූලි - සැප්තැම්බර් ඔක්තොම්බර් 28
ඔක්තොම්බර් - දෙසැම්බර් පෙබරවාරි 28
ජනවාරි - මාර්තු අප්‍රේල් 28
අප්‍රේල් - ජූනි ජූලි 28

3* වාර්ෂිකව ගෙවීම තෝරාගත් ව්‍යාපාර

භාණ්ඩ හා සේවා බදු ගෙවීම හා වාර්තා කිරීම කල යුත්තේ

- ආදායම් බදු ගෙවීමට නියමිත දිනය හෝ
- ආදායම් බදු ගෙවීමට නියමිත වර්ෂයෙන් පසු එළඹෙන පෙබරවාරි මස 28 දිනට පෙර (මෙම




දිනය අදාල වන්නේ ඔබට ආදායම් බදු වාර්තා කිරීම අවශ්‍ය නැතිනම් පමණි.)

### භාණ්ඩ හා සේවා බදු ඉන්වොයිසිය GST Invoice

1* මිලදී ගැනුම් සඳහා When Purchasing

ඔබ කිසියම් වූ මිලදී ගැනීමකදී භාණ්ඩ හා සේවා බදු ගෙවූ විට එම මිලදී ගැනීම $82.50 වඩා වැඩිනම් ඔබට බදු අයකරගැනීමට (To Claim GST) අනිවාර්යෙන්ම (Purchase Invoice) මිලදී ගැනීම ඉන්වොයිසියක් තිබිය යුතුය. ගනුදෙනුකරු-වෙක් බදු ඉන්වොයිසය ඉල්ලීමක් කල විට, එම ඉල්ලීම දින 28ක් ඇතුලදී ඉටුකර දිය යුතුය. කෙසේ වුවත් බදු ඉන්වොයිසයක් නිකුත්කල හැක්කේ භාණ්ඩ හා සේවා බදු සඳහා ලියාපදිංචි වූ ආයතනයකට හෝ පුද්ගලයෙකුට පමණයි.

2* විකිණීම සඳහා When Selling

විකුණුම් ඉන්වායිසියක් නිකුත් කිරීමේදී පහත කරුණු එම ඉන්වොයිසිට ඇතුලත් විය යුතුය.

- එම ඉන්වොයිසිය බදු ඉන්වොයිසියක් බවට සඳහන් කිරීම (Intended as a tax invoice)

- විකුණන ආයතනයේ නම (Seller's Identity)

- විකුණන ආයතනයේ බදු අංකය (Seller's ABN)

- ඉන්වොයිසිය නිකුත් කල දිනය

- මිලදී ගන්නාගේ නම/ බදු අංකය (Buyer's Identity/ABN)

- මිලදී ගන්නා භාණ්ඩ හෝ සේවාව පිළිබඳ විස්තර

- එම භාණ්ඩයට හෝ සේවාවට අයකරන භාණ්ඩ හා සේවා බදු ප්‍රමාණය




